# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,471 - 2026 ජනවාරි මස 09 වැනි සිකුරාදා - 2026.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් | — |
| අවසාන නියෝග | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත | — |
| මධ්‍යම පළාත | — |
| දකුණු පළාත | — |
| උතුරු පළාත | — |
| නැගෙනහිර පළාත | — |
| වයඹ පළාත | — |
| උතුරු මැද පළාත | — |
| ඌව පළාත | — |
| සබරගමුව පළාත | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත | — |
| මධ්‍යම පළාත | — |
| දකුණු පළාත | — |
| උතුරු පළාත | — |
| නැගෙනහිර පළාත | — |
| වයඹ පළාත | — |
| උතුරු මැද පළාත | — |
| ඌව පළාත | — |
| සබරගමුව පළාත | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | 10 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | 12 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 30 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 16 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

09 - B 082753 - (2026/01)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

සංශෝධනයයි

**ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - වනාතවිල්ලුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මගේ යොමු අංකය : ඉලි/10/2/77.

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1,890 අංක දරන හා 2014 නොවැම්බර් මස 21 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 104 වගන්තිය යටතේ වූ නිවේදනයේ දීමනාපත්‍ර අංකය ආර් 10590 ලෙසත්, විරෝධතා ඉදිරිපත් කිරීමට ලබාදී ඇති දිනය 2026.02.23 ලෙසත් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. ප්‍රභාකරන්,
ප්‍රාදේශීය ලේකම් (රා. ආ.),
වනාතවිල්ලුව.

2025 දෙසැම්බර් මස 27 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-116

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, කේ. ෂාමලි ප්‍රියංගිකා පියතිස්ස වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ, අතිගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන විසින් 1986.03.21 දින ප්‍රදානය කර ඇති අංක කෑ/ප්‍ර 4052 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පොල්දෙනිය ජනපදයේ පදිංචි හොරනෑකාරයලෑ සුද්දනා වෙත ප්‍රදානය කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 431 යටතේ 1993.11.23 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය, උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගල්බොඩ කෝරළේ බටහිර, නිකපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නිකපිටිය නැමති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති මූ. පි. කෑ. 1840 කැබලි අංක 47 දරන හෙක්ටයාර් 0.097 විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම පොල්දෙනිය ජනපදය (ඉඩමේ නම)

| | |
|---|---|
| *උතුරට* | : මූ. පි. කෑ. 1840 හි කැබලි අංක 31 සහ 30 |
| *නැගෙනහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 46 |
| *දකුණට* | : මෙම පිඹුරේ කැබලි අංක 48 සහ 49 |
| *බස්නාහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 30 |

ෂාමලි පියතිස්ස,
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2025 ජූලි මස 18 වැනි දින.

01-93/1

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

සබරගමුව පළාත් සභාවේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් වී. ඕ. එල්. එස්.රත්නසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.09 දින ප්‍රදානය කර ඇති අංක කෑ. ප්‍ර. 9236 දරන ප්‍රදාන පත්‍ර හිමිකරු වන ජේ. 5/5 ඒ, අශෝකපුර පාර, සිංහරාජගම, ඇල්පිටිය, දෙවනගල පදිංචි, කිරිහටනලාගේ දේවයා වෙත ප්‍රදානය කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මාව/3/98 යටතේ 1995.11.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම්

විරෝධතාවක් ඇත්නම් එය 2026.01.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තුන්පලාත පත්තුව නැගෙනහිර වෙරකේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අල්පිටිය නැමති ගමෙහි පිහිටා ඇත්තා වූ ද, භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක කෑ 490/019 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පී. පී. කෑ. 697 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/ අංක F දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : සිංහරාජවත්ත

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අක්ෂර C සහ E |
| *නැගෙනහිරට* | : කැබලි අක්ෂර G සහ C |
| *දකුණට* | : ප්‍රවේශ මාර්ගය සහ කැබලි අක්ෂර N |
| *බස්නාහිරට* | : කැබලි අක්ෂර E සහ ප්‍රවේශ මාර්ගය |

වී. ඕ. එල්. එස්. රත්නසේකර,
ප්‍රාදේශීය ලේකම්,
මාවනැල්ල.

2025 ජනවාරි මස 22 වැනි දින.

01-93/2

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

සබරගමුව පළාත් සභාවේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් එච්.ආර්. මධූෂි පූර්ණිමා අබේරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනත (320 පරිච්ඡේදය) යටතේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් 1961.09.25 වන දින ප්‍රදානය කර ඇති අංක R 6609/6610 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන උඩගොඩවත්ත, උඩුගොඩ පදිංචි සමාඩ් මොහොම්මඩ් මොහිඩීන් වෙත ප්‍රදානය කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක R 6609/6610 යටතේ 1961.11.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙලිගල් කෝරළේ කඳුපිට පත්තුව දකුණ, පුස්පනේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පුස්පනේ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක එල් 4/18, 26 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක පී. පී. ඒ. 811 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 153 දරන ප්‍රමාණයෙන් රූඩ් 02, පර්චස් 16 ක් වූ බිම් කැබැල්ල, සහ අංක 132 හා 140 දරන ප්‍රමාණයෙන් අක්කර 03, රූඩ් 01, පර්චස් 33 ක් වූ බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ උඩගොඩ වත්ත නමැති රජයේ ඉඩම

කැබලි අංක 153

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 156 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 154 |
| *දකුණට* | : කැබලි අංක 152 හා ගල |
| *බස්නාහිරට* | : කැබලි අංක 160 1/2 |

කැබලි අංක 140

| | |
|---|---|
| *උතුරට* | : මාර්ගය |
| *නැගෙනහිරට* | : ඇල |
| *දකුණට* | : කැබලි අංක 141 |
| *බස්නාහිරට* | : මාර්ගය |

කැබලි අංක 132

| | |
|---|---|
| *උතුරට* | : දෙල්වල ඇල රක්ෂිතය |
| *නැගෙනහිරට* | : ඇල |
| *දකුණට* | : මාර්ගය |
| *බස්නාහිරට* | : මාර්ගය |

එච්. ආර්. එම්. පී. අබේරත්න,
ප්‍රාදේශීය ලේකම්,
බුලත්කොහුපිටිය.

2025 ජූලි මස 14 වැනි දින.

01-93/3

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

සබරගමුව පළාත් සභාවේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, ඒ. එම්. රංගන සජීව වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය

යටතේ, චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපති විසින් 1997.01.30 දින ප්‍රදානය කර ඇති අංක කෑ. ප්‍ර. 14534 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බටදොලේවත්ත ජනපදයේ පදිංචි මාරසිංහ පේඩිගේ සුමනපාල වෙත ප්‍රදානය කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක වර/7/123 යටතේ 1997.08.13 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කීරවැලි නැගෙනහිර පත්තුවේ, බෙලිගල් කෝරළේ, මාහේන ජනපදය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාහේන නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කෑගල්ල මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති අංක මූ. පී. කෑ. 2108 හි කැබලි අංක 98 හි කොටසක් දරන හෙක්ටයාර් 0.121 විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම බටදොලේ වත්ත.

| | |
|---|---|
| *උතුරට* | : අයි. එච්. බණ්ඩාට අයත් රජයේ ඉඩම |
| *නැගෙනහිරට* | : ප්‍රවේශ මාර්ගය හා එම්. චන්ද්‍රාවතීට අයත් රජයේ ඉඩම |
| *දකුණට* | : මාරගහමුල පුද්ගලික ඉඩම |
| *බස්නාහිරට* | : රිදියපාන ඇල රක්ෂිතය |

ඒ. එම්. රංගන සජීව,
ප්‍රාදේශීය ලේකම්,
වරකාපොල.

2025 ජුනි මස 16 වැනි දින.

01-93/4

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/78236.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NCP/PLC/L-09/01/04.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 510 - කඩියංගල්ල ග්‍රාම නිලධාරි වසමේ කඩියංගල්ල ගමේ ඉඩම් නිලධාරි විසින් සකස් කරන ලද දළ අනුරේඛනයේ අ. ග. පි. අංක 825 හි කැබලි අංක 02න් කොටසක් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 02 පර්. 34 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා සෙනෙවිරත්න මුදියන්සේලාගේ දයිවින් සෙනෙවිරත්න මයා නමින් දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : සුජීවාගේ ඉඩම |
| *නැගෙනහිරට* | : ප්‍රවේශ මාර්ග රක්ෂිතය |
| *දකුණට* | : ධම්මිකාගේ ඉඩම |
| *බටහිරට* | : අතුරු මාර්ග රක්ෂිතය |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.07.23 දින සිට 2055.07.22 දින දක්වා);

*වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) හෝ රුපියල් මිලියන පහකට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳ පොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඈ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයෙ.

(ඇ) පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඉ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඊ) 2025.07.23 දින සිට අවුරුදු 05ක් ගතවන තුරු පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම හෝ පැවරීම සඳහා අවසර දෙනු නොලැබේ.

(උ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,  
සහකාර ඉඩම් කොමසාරිස්,  
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 දෙසැම්බර් මස 29 වැනි දින,  
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,  
"මිහිකත මැදුර",  
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි  
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-138

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.